**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ප්‍රාථමික අංශය**
**සැකසුම ~ W.D.G.M. ටිකිරි සිරි කුමාරි**
**ගුරු උපදේශක**
**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

# 3 ශ්‍රේණිය
# විෂ ය සමගාමී ක්‍රියාකරකම්

## කාසි කැටයක් හදමු.

#දුවේ , පුතේ ,මුදල් පාඩමෙන් කාසි,නෝට්ටු හදුනා ගත්තා නේද. අද අපි කාසි කැටයක් සකස් කර ගෙන මුදල් එකතු කරමු.

#අවශ්‍ය දෑ
හිස් පවුඩර් බෝතලයක් හෝ ක්‍රීම් බෝතලයක් ,ටින් එකක් , පුහු පොල් ගෙඩියක් වැනි යමක් .

#ඔබ සොයා ගත් භාජනයේ කාසි දැමිය හැකි වන සේ කටක් සකස් කර ගන්න .දැන් මූඩිය ඇරිය නොහැකි සේ හොදින් වසන්න. නැතිනම් කඩදාසියක් අලවා ගන්න.



#දැන් ඔබ  කාසි කැටයක් සාදා ගත්තා.
වැඩිහිටියන්ගේ උදවු ඇතිව කාසි සපයා ගන්න. හැකි සෑම දිනකම කැටයට කාසියක්දමන්න.
කාසි කැටය පිරුණු දවසට ඒ මුදල යහපත් දෙයකට යොදවන්න ඔබට පුළුවන්.